# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2143/53 – 2019 ඔක්තෝබර් 04 වැනි සිකුරාදා – 2019.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 පෙබරවාරි මස 07 වැනි දින අංක 1796/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2013 අංක 39 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද, ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 08 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/16.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: WRSWD&EIP/ACQ/KB/04.
2019 ජූලි මස 18 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැඳුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 535 ඩී, දිවුලපිටිය නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දිවුලපිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කො. 9568 හා 2016.10.21 දිනැති සංශෝධිත මුලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටස්වලට මායිම් :

01. **කැබලි අංක 15 – පරණ කැස්බෑව පාරේ වරිපනම් අංක 89 දරණ ඉඩමේ කොටසක් – ප්‍රමාණය: හෙක්. 0.0316**
උතුරට: කැබලි අංක 89, පාර සහ පරණ කැස්බෑව පාරේ වරිපනම් අංක 89 දරන ඉඩම; නැගෙනහිරට: පරණ කැස්බෑව පාරේ වරිපනම් අංක 89 දරන ඉඩම; දකුණට: පරණ කැස්බෑව පාරේ වරිපනම් අංක 87 A දරන ඉඩම්, කැබලි අංක 16, 92, 91 සහ 90; බටහිරට: කැබලි අංක 92, 91 සහ 90.

02. **කැබලි අංක 16 – පරණ කැස්බෑව පාරේ වරිපනම් අංක 87 A දරණ ඉඩමේ කොටසක් – ප්‍රමාණය: හෙක්. 0.0141**
උතුරට: කැබලි අංක 15, පරණ කැස්බෑව පාරේ වරිපනම් අංක 89, 87 A දරන ඉඩම; නැගෙනහිරට: පරණ කැස්බෑව පාරේ වරිපනම් අංක 87 A දරන ඉඩම; දකුණට: කැබලි අංක 94, 93, 91 සහ 92; බටහිරට: කැබලි අංක 92 සහ 15.

10 - 649